# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Political Science** | **Grade 12** | **Medium: Sinhala**

12 ශ්‍රේණිය

ප්‍රශ්න පත්‍ර අංක 02

❖ පහත ප්‍රශ්න ඇසුරින් ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

01. **දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ නිශ්චිත ධාරාවක් ලෙස තුලනාත්මක දේශපාලනය(Comparative Politics) හඳුන්වාදිය හැක. දේශපාලන අධ්‍යයනයෙහිලා මෙකී ධාරාවෙහි ඇති අදාලත්වය විස්තර කරන්න.**

02. **රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතවාදයේදී රාජ්‍ය ප්‍රභවය, විකාශනය හා එහි අනාගතය පිළිබඳව සිදුකරනු ලබන විග්‍රහය සාකච්ඡා කරන්න.**

03. **රාජ්‍යයෙහි ස්වාධිපත්‍ය බලය බෙදීම පදනම් කොටගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘතියක් ලෙස ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතිය හඳුනාගනී. මෙම ක්‍රමයෙහි ලක්ෂණ හා ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කරමින් විග්‍රහයක් සපයන්න.**

04. **පහත ආණ්ඩුක්‍රම ආකෘති අතරින් 02ක් පමණක් විස්තර කරන්න.**

I. **මිශ්‍ර ආණ්ඩුක්‍රමය ( Mix Government )**

II. **සහ සන්ධීය ආණ්ඩුක්‍රමය ( Co-Federalism )**

III. **ඒකතන්ත්‍ර ආණුඩුක්‍රමය (Autocracy )**

05. **දේශපාලන මතවාදයක් ලෙස ස්ත්‍රීවාදය (Feminism) ඔබ අර්ථ විග්‍රහයට ලක් කරන්නේ කෙසේද?**

## 12 ශ්‍රේණිය

## ප්‍රශ්න පත්‍ර අංක 03

❖ පහත ප්‍රශ්න ඇසුරින් ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

01. **ගැටුමක් යන්න ඔබ අර්ථ නිරූපනය කරන්නේ කෙසේද?**

02. **ලුවිස් ක්‍රිස්බර්ග් ( Louis Krisberg ) විසින් හඳුන්වා දෙන ගැටුම්වල ජීවන චක්‍රය (Conflict Life Cycle) ඇඳ දක්වා එහි අවධීන් වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.**

03. **ගැටුම් සමථනය දීර්ඝ කාලීන ක්‍රියාවලියක් වන නිසාම එය මූලෝපායික උපක්‍රම රාශියකින් සමන්විත වේ. මේවා විග්‍රහ කරන්න.**

   I. **ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම. ( Early warning )**

   II. **ගැටුම් වැලැක්වීම ( Conflict Prevention )**

   III. **ගැටුම් කළමනාකරණය (Conflict Management)**

04. **ගැටුම් වර්ගීකරණයේදී එක් අංගයක් ලෙස ගැනෙන දේශපාලන ගැටුම් වර්ගීකරණය පිළිබඳ පීටර් වොලන්ස්ටීන් (Peter Wallensteen)විසින් සිදුකරන විග්‍රහය පුළුල්ව විස්තර කරන්න.**

05. **ගැටුම් සමථන ක්‍රියාවලියේදී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍යයන් කිහිපයක් පහත දැක්වේ. ඉන් දෙකක් පමණක් සාකච්ඡා කරන්න.**

   I. **සහමන්ත්‍රණය (Negotiation)**

   II. **මැදිහත්කරණය (Mediation)**

   III. **සාම ගිවිසුම් (Peace Agreement)**

   IV. **සාමය ගොඩනැගීම (Peace Building)**